ඩිප්‍රෙෂන් නොහොත් අබුද්ධස්ස සිහිනය

චම්පික කේ. අයගම

ඩිප්‍රෙෂන් නොහොත් අබුද්ධස්ස සිහිනය

කතෘ - චම්පික කේ. අයගම

ප්‍රථම මුද්‍රණය - 2023

ISBN- 978-624-94561-0-5

පිටකවර සැකසුම - චම්පික කේ. අයගම

පරිගණක අකුරු සංයෝජනය - චම්පික කේ. අයගම

මුද්‍රණය - **E- Copy @**

ප්‍රකාශනය - කතෘ ප්‍රකාශන

පිදුම........

දිසාපාමොක් පරපුරෙන් නෙලාගත්
මහෝසධ සිහිනයේ අමරාව,
ප්‍රේමයේ යසෝදරාව,
පරිත්‍යාගයේ මන්ත්‍රිය,
කරුණාවේ මහමායාව,
සත්‍යයේ සම්බුලාව,
දයාවේ බිම්බාව,
ශීලයේ කණ්නගිය,
සුන්දරත්වයේ පබාව,
සංසාර පුරුද්දට මෙන්
අබුද්ධස්ස නිසාම
නින්දා- අපහාස
ගැරහුම් - අවමාන
දුක්ක දෝමනස්ස
සෝක - පරිදේව
කප්පරක් ගිණි උහුලන
දිශාපාමොක් දෝණියට...!
ප්‍රේමයේ අනාතියට......!
ආදරයේ කන්‍යාවියට.....!

********* අබුද්ධස්ස සිහිනය *********

කාලයේ වැලි තලාව යට සැගවුන

පුංචි මතකයක්

භාර අවුස්සන්නේ නැහැ මම,

හැම විටම වර්තමානයේමයි.

වෙලාවකට එරමිනිය ගොතාගෙන,

තවත් විටෙක නිදාගෙන,

ඇවිදින විටත්,

කතා කරන විටත්,

කුමන විදියහකදි වුනත්

වර්තමානයේමයි.....

ඒක අපූරු දහමක්

ඇත්තමයි!!..

මේ කියන්නේ යෝනිසෝ මනසකාරය ගැන වෙන්න ඇති

අනේ නැහැ

එහෙම එකක් නෙමෙයි

එක අරමුණක හිත තියාගෙන

අහසත් එක්ක,

පොලවත් එක්ක,

ඉර හඳ තාරකා

ඒ විතරක් නෙමෙයි.......

අසල් වැසි ඥාති හිතමිත්‍රාදීන්

මේ හැමෝමත් එක්ක

කතා කළත්

හිනා වුනත්

මගේ හිත එකම එක අරමුණක

තදින් ඇලිලා..

තදින් බැඳිලා...

තදින්ම තදින් ග්‍රහණය කරගෙන

අධිෂ්ඨානශීලී භාවනාවක්

මට හිතෙනවා ලගදිම දවසකදි

පාවෙලා යාවි උඩහට

මගේ පාත්තරය

හරි අපූරුවට...

දවසක අනේකජාති සංසාරන් කියලා

උදාන වාක්‍යයක් කියාවි

ඒත් එක්කම

අනිමිස ලෝචන පූජාවෙන් බලා සිටීවි

නිසොල්මන්ව

එක ඇසිපිල්ලක්වත් නෙසෙල්වා

කළ ගුන සලකන්නද මම දන්නේ නැහැ

කොහොම වුනත් ළගදිම දවසකදි එහෙම වේවි...

එයින් හත් දවසකට පස්සේ රුවන්ගෙයි

හැබැයි රුවන් සක්මන කරන්න ඕනි නැහැ මට

ඒ කාගෙවත් මානයක් බිදින්න ඕනි නැති නිසා

රුවන් ගෙය අපූරු තැනක් වේවි නේද?

තට්ට තනියම

කට්ට කැලෑවක

තනිකමත් කජ්ජක්ද?

කල්ප අසූහාරලක්ෂයක්

තනියම පෙරුම් පිරූ මට

කවුද හිටියේ මගේ පස්සෙන්

අනේ.. ඔබට අමාරුයි නොවැ

කෝ දීපන් මට ඔය

බරෙන් ටිකක් මෙහාට

නෑ..... කවුරුත් නෑ....

එහෙම හිටියේ නෑ මට

ඉතිං ඒක මොන කෙහෙල් මලක්කද?

කල්ප ගනන් පෙරුම් පිරුවේ

සත්‍ය ජය ගන්නනම් නෙමෙයි

කවුරුත් හිතයිද දන්නේ නැහැ

මේ උත්සාහය බුදු වෙන්න කියලා

කවුරු මෙනවා හිතුවාහම මගේ මොකද?

ඔහොම තමයි ජීවිතේ හැටි........................

****

දුණු ශිල්ප,

කඩු ශිල්ප,

කෙළවරක් නැති ආත්තෝපදේශ

කුමාර යුගයෙදි හරි හරියට

මා සක්විති වෙයි කියලා හිතාගෙන වෙන්නැති

කොහොම උනත් ඒ යුගයෙදි

පිය රජ්ජුරුවන්ට හරියට ආක්‍රමණ

එකක් නම් මැදෑ............

බාප්පොච්චලා එහෙන්

උරුමෙට රජ කමට

පිය මිත්තනිය

නෑදෑ සනුහරේ

මාලිගාව තුළත්

ඇයි පිටත

ඒ මදිවට භාණ්ඩාගාරය??

අතහැරියේ නැහැ ලේසියෙන්

උට්ඨානය, වීයීය.....

මැණියන්ගේ කිරි සුවඳ

හැමදාමත් කිරි කළ හතක්

අපොයි නැහැ

ඊට බොහෝම වැඩියි

පිය රජ්ජුරුවන්ගේ අගබිසව

ඇයි මෙච්චර වෙහෙසක්

කරදරයක්?

උතුරන්න දරු සෙනෙහස

කවුරු වෙනුවෙන්ද?

හැමදාම කනස්සල්ලෙන්

අපොයි!!!.

උසුලන්න බැහැ ඒ මුහුණ

ඇයි ඒ!!!

කටින් මුමුණන්න බැරි තැන

අහනව මම

හඳවතින් !!!!

උත්තරේ මේකයිලු

අදත් පොල්කටු පාළු විතරයි මා පුතේ......

කකුල් දෙකේ දෝලාවෙන්

පිය රජ්ජුරුවෝ

හැම ඉරු දිනෙකම

නගරවීදියට

හරිම උජාරුවෙන්

වීදි සංචාරයක

බැලූ බැලූ අත

නෙක විසිතුරු දසුන්

පාලනය නරකක් නැහැ වගේ ??

රට වැසියන් යෙහෙන්

ආ.... සින්න තම්බි

කෙහොමද බඩු මිළ?

වරදක් නැහැ... ආයුබෝවන්ඩ!

සහල් සේරුවක් පවුම් දෙකයි

සීනි අවුන්සයක් පවුම් එකයි

හොඳයි... හොඳයි....

පිය රජ්ජුරුවන්ට රාජ උෂ්නේ වැඩි වෙලා වගෙයි

මුල සිටන් අගටම

නගර වීදිය පුරාම

පුංචි පරීක්ෂණයක් වෙන්නැති

ළඟදීම දවසකදි මිළ ගනන් සංශෝධනයක්ද?

විදිය එහා මුල්ලෙම කැඩිච්ච බක්කියෙන්

ඔක්කොගෙන්ම අවුන්ස කාල ගානේ

පියානන්ගේ පැස තුලට

තැන තැන නෙක උයන්,

දන්සැල් සුරා සැල්,

නගර වැසියන් ප්‍රීතියෙන්

මහත් උජාරුවෙන්

තේජාන්විත ලැම ප්‍රදේශයේ පසුම්බියට

බලාපොරොත්තු දහසක් දල්වාගත් නෙතින් බලා

රන් කහවනුවක්ද මිට මොලවා

පුරුද්දට මෙන් ඉබේටම

සැකෙන්, බියෙන්, කාංසාවෙන් මෙන්ම
බලාපොරොත්තුවෙන්

අස්වගාලද නිරීක්ෂණයක!!!!!

ඉර අවරට ගිහින්

එමින් ගමනෙදි සුරා සැලටද

එහිද නැත කිසි අඩුවක්

නගරය යොහන්........

නොවරදවාම හවස්ජාමෙට රාජ සභාව

ලාභ, අලාභ, නින්දා, ප්‍රශංසා

සැප, දුක, යස, අයස

අඩුවක්ම නැහැ

මහ ඇමති, බාප්පොච්චි

කුඩප්පච්චි, මහප්පච්චි

පිරිවරාගෙන

වාද, විවාද, තර්ක, විතර්ක, නඩු හබ

සුද්ධ සිංහලෙන්ම!!!!!!

චෝදනා පිට චෝදනා

තර්ජන, ගර්ජන, කඩු හරබ

අරක්කැමි දාස මහරැජිණිය

හැඩූ කඳුලින්

දූ දරුවන්ද සමඟ,

පිය රජ්ජුරුවන් නෙරපාවිදැයි සැකයි

මේ ධර්ම රාජ්‍යයෙන්......

රාත්‍රී රාජ භෝජනය

ඇට කුණා වූ බතට

ලුණු රස පමනක් වැඩියෙන්ම දැනේවි

මැණියන්ට හා දූ දරුවන්ට

පියාණන්ට දැනුනහොත්

හිස ගසා දැමීමට අණ

අහිංසක අරක්කැමියාගේ.!!!!!

ඔටුන්න හිමි කුමාරයා

සියල්ල විමසිල්ලෙන්.....

අනේ.... මේ තරම් කැපවීමක්

මේ තරම් උනන්දුවක්

කාවෙනුවෙන්ද?

රට වැසියන් වෙනුවෙන්!!!

කළ නොහැකියි එම කැපවීම

අත්හල යුතුයි

ඉවත හළ යුතුයි

රජකම!!!

අලුයම ඉවත ලූ කුණු කෙළ පිඩක් සේ...

ගලවා දමා දුණු හී අබරණ

සිහින රාජ්‍යයේ කොස් කොළ ඔටුන්න

විසි කළෙමි අවබෝධයෙන්ම

කිසි දිනෙක නැවත පළඳා නොගන්නා අටියෙන්

බාල බොළඳ වියේ දීම......

අනාගත සිහින රාජ්‍යයේ

සෙල්ලම් නිවසින්

කාටත් හොරා පැනවිත්

වසා ගති දොර පියන් පත්

ගොතා ගත් එරමිණියාවෙන්ම,

"හදවත"

සාප කරමින් ඔටුන්නට

සෙවුවෙමි

අනාගත ධර්ම රාජ්‍යයේ මහෝසධයන්.......

තක්ෂලා මස්තකේ

දසත විහිදුන අඹ ගසෙහි

කොළ හැලී වියලී

නාටු වුන අඹ ගසෙහි

ඉහලම ඉහළ මැරුණු අත්තේ

එකම එක දල්ලක් සමග

ඉදිනු රන්වන් අඹ ගෙඩියක් සිහිනෙන් දැක

අබුද්ධස්ස ඇතැතිව තිබූ ගල් කැටයෙන්

දෙයස් වසා ඉබා ගාතයේ විසි කළ ගල

ඉහළම ඉහළ අත්තේ තිබූ

එකම එක අඹ ගෙඩියෙහි

සිහින් නාරටියේ වැදී

අබුද්ධස්ගේ දෝතටම වැටුන සඳ

සිහිනෙන් අවධි විය අබුද්ධස්ස...........

****

පසු පස ඉරුණු කලිසමට

අණ්ඩ දමා රන් හුයෙන්

කරට කරපටිද නැති

පයට ලාඩන්ද නැති

නියරෙන් අස්වැද්දුමෙන් පැන

අකුරට දුවපු

ක්ෂත්‍රිය පරපුරේ

ගොන් පරම්පරාවේ

අයාලේ ගිය

යහළු, යෙහෙලි, අසල්වාසී, ආචාරීන්ගේ පිං ගොන

වන පෙත් කර වේද ග්‍රන්ථ

යන්ත්‍ර මන්ත්‍ර, ශ්‍රාෂ්ය පාලනය

එකී නොකී පොත් පත් පරිශීලනයෙන්

විෂය කරුණුවලින් අසමත්ව

සිතීමේ ශක්තියෙන් බහුශ්‍රැතව.....

මහා තක්ෂලාවට පිළිපන් මහෝසධ සිහිනය

කේවට්ටාචාරීන්ගේ සරදමට.......

අබුද්ධස්ස කාලයක මහිම

එදවස මහෝසධ - මෙදවස ශිෂ්‍යයෙක් වැ.....

කේවට්ටයන් ආචාරීන් යැ....

මහා තක්ෂලාවේ දිසාපාමොක් මියැදැ...

ගෝලයන් වල්මත් යැ....

නාස් ලණු , තෝන් ලණු

කෙවිටි බාන් ලණු පාලනයට

ළඟදීම දවසකදි

ගොන් ගස්වලට, හී ගස්වලටත්

අඹන දවසද එතරම්ම දුර නැත.......

ඇසූ තරමින් අදහන

කියූ තරමින් පිළිගන්නා

කාලාමයන්ගෙන්

මහා තක්ෂලාව පිරිපුන්ය....

සන්නාසියෙකු සේ සොයා යන,

ඉන්ද්‍ර කීලයක් සේ නොසෙල්වන,

පුරුෂ ලිංගයක් සේ නැගී එන එවුන්

යෝනි තුඩක් සේ සංවේදී නම්!

මඩු වල්ගෙන් තලා,

හන්වඩු ගසා,

කේවට්ටාචාරීන්ගේ බිරින්දෑගේ පා පහරින්

තක්ෂලාවෙන් එළියට

අකීකරු, අකීකරුම මූසිලයෙකු ලෙස.........

නොමැත එහි සරණක්

කැටුව යා හැකි ගමනක්

ඇත මහලු කෙමනක්

පිටවන්න බැරි අමුතු උගුලක්...!

මහා තක්ෂලාවේ

බැමි සියලු හැරදා

එළිපත්ත මතට වී

මෙනෙහි කර බැලී මුත්

ඉන්කා, මායා, ඉංදු, හරප්පා

මිසර, ග්‍රීක, ඇතැන්ස්

සොක්‍රටීස්, පුලූටෝ

තබා එළිපත්ත මත

ඇවිද ආවෙමි ඉබාගාතයේ

අමුම අමු හෙලුමෙන්........

****

දුණු ශිල්ප, කඩු ශිල්ප,

එකී නොකී ශිල්පයන්ගෙන් බහුශ්‍රැතව

ධර්ම රාජ්‍යයේ සේවයට පිළිපන්

මහෝසධ පිල්ලිය,

දුගී, මගී, යාචක

අනාත, අසරණ, අත්හල

රජ, සිටු වෙනුවෙන්

අපක්ෂපාතී සේවයට

රාජ සභාවෙන් සභාවට,

දිශාවෙන් දිශාවට,

ආයතනයෙන් ආයතනයට,

නෙලුම් කොළ මත දුවන කොරවක්කන් අතරේ

පත්ව බැලුවෙමි

අපක්ෂපාතී සේවයක්.....

සොයා බැලුවෙමි,

බලා සිටියෙමි,

ටයි කෝට් හැඳ පැළඳ

සීත කුටි තුළ

බමන පුටු මත

හැන්දෙන් ගැරුප්පුවෙන්

කාලය කාදමන අපූරුව............

ට්‍රිරීන්........... ට්‍රිරීන්.........

හලෝ.......... හලෝ...........

මහත් බර වූ හඩින්

ගරු ගාම්භීරව

ඉහළින්ම ඔඩරයක්

කපාපන් ලිස්ට් එකෙන්

දමාපන් කුට්ටිය

හංගපන් සාක්ෂි

දාපන් පැකට් එකක්

ඌ අපේ එකෙක්

මහෝසධගේ හෘද සාක්ෂිය

ඉකි ගසා හඬන හදවත,

තමා උගත් ශිල්පය,

කඩු, කිනිසි, කළු ධජ

උස්සා එරෙහි වූ සඳ

රාජ උදහසට ලක් වූ මහෝසධ පිල්ලිය

නැවතත්

මහා රාජෝත්තමයන්ගේ

බත් බැලයාගේ

හොර බිරින්දෑගේ පා පහරින්

රාජ සභාවෙන් එළියට……

****

දිසාපාමොක් පරපුරෙන් නෙලාගත්

මහෝසධ සිහිනයේ අමරාව,

ප්‍රේමයේ යසෝදරාව,

පරිත්‍යාගයේ මන්ත්‍රිය,

කරුණාවේ මහමායාව,

සත්‍යයේ සම්බුලාව,

දයාවේ බිම්බාව,

ශීලයේ කණ්නගිය,

සුන්දරත්වයේ පබාව,

සංසාර පුරුද්දට මෙන්

අබුද්ධස්ස නිසාම

නින්දා- අපහාස,

ගැරහුම් - අවමාන,

දුක්ක දෝමනස්ස,

සෝක - පරිදේව,

කප්පරක් ගිණි උහුලන

දිශාපාමොක් දෝණිය,

ප්‍රේමයේ අනාතිය,

ආදරයේ කන්‍යාවිය,

සමුගන්න අවසරයි, පෙරසේම නුඹෙන්,

අසාධාරණ වූ - සාධාරණයෙකුට,

අයුක්තිකාමී - යුක්තිකාමියෙකුට,

ආත්මාර්ථයේ පාර්ථකාමියෙකු වූ

අබුද්ධස්සට..........

****

කාමසුකල්ලිකානු යෝගයෙන් ඔද්දල්ව

රම්‍ය, සුරම්‍ය, සුබ

අවන්හලෙන්, අවන්හලට,

සුරා සලින්, සුරා සැලට,

සල්ලාලයෙකු මෙන්

සාලාවතී, විමලා, අම්බපාලිලා ඇසුරෙහි

කජ්ජුරාවෝ බඳු

රසෝසයේ කිමිද

මුළු ලොවක් පීරා

සිතෙහි උපන් සිහින රූපයේ

එකම එක රෝම කූපයකුදු නොවෙනස්ව

ස්වංවරයෙන් නෙලාගත්

නුඹගේ පහසින් සංතෘප්තව

මුවට මුව තබා

උපරිම සුරතාන්තයට පත්

අබුද්ධස්සට

තවත් ලෞකික සැපයක් තිබෙනුද

විදින්නට මිහිපිට!!!!!

ඒ මහා රස බුංජය

මාගේ නිදන කුටියේම

තවෙකකුගේ පහසින්

කුල්මත් වනු දැක

සෙමින් දොර වසා

අබුද්ධස්ස නික්ම ගොස්ය,

මුනින් දස්ස සොයා ගොස්ය.........

රක්ත වර්ණ නාගයෙක්

සුදෝසුදු හංසයෙකුට හාදු දී

පෙන ගොබ විදා

විෂ දළ උලුප්පා

ගිණි දළු පිඹ

බිහිසුන රත් වන් දෙයැස් එල්ල කර

දෂ්ඨ කරන කළ

අබුද්ධස්ස...........

සිය අසිපතින්

දෂ්ඨ කරනා වාරක් පාසා

පෙන ගොඹය හිසින් වෙන් කළද

එම කවන්දය

නැවත නැවතත් දළුලා වැඩී

දෂ්ඨ කරනා සඳ

දෙදෙනාම අපරාජිතව

නාගයා දුර්වර්ණ වී

කඩුව කෙමෙන් මොට වී යන කළ

අබුද්ධස්ස සිහිනෙන් අවධිවිය

****

ඉතිං මා ප්‍රිය සබඳ...........

විප්‍රයෝගයේ සන්තුෂ්ටියෙන්

සම්ප්‍රයෝගයේ උමතුවෙන්

කුරුවල්ව ගිය ආත්මයක් සංසිඳුවන්නට

පන්සලින් පන්සලට,

පල්ලියෙන් පල්ලියට,

විහාරයෙන් විහාරයට,

ආරාමයෙන් ආරාමයට,

ජටිල, නිඝණ්ඨ, බ්‍රාහ්මන, තාපසාදී

මහා ප්‍රතාපවත්, සමාජ ශෝධකයින් ඇසුරෙහි

අබුද්ධස්ස, මුනින්දස්ස

සොයා ගොස්ය, සොයා ගොස්ය......

අමා වැස්ස - සෝම නස්ස,

කෙලවරක් නැති ධම්ම දෙස්ස,

තුලින් දිටියෙමි

ෆ්‍රොයිඩ්, නිවුටන්, ඩෙකාට්, ඇරිස්ටෝටල්

සච්චක කුලයේ මුණිවරුන්.........

බියෙන් තැතිගෙන

වෘක්ෂ, පර්වත, රන්මුවා, සෙල් මුවා, නෙකරුව
සරණ යන තැන සොයා බැලුවෙමි

එකම එක දම්රුවා රූපයක්........

මහා යතිවරුන්ගේ

අතින් අත විසි වුන

මුනින්දස්ස සිහිනය අතහැර

ගිරි දුර්ස - වන දුර්ස

මංමාවත් වීදි දිගේ

සීරුවෙන් හා ප්‍රවේශමෙන්

පිය නැගුවෙමි සරණ සොයමින්

බුදු පසේ බුදු වරයෙකුගේ............

මා මැණියන්ගේ

සිහින සංගරයේ නෞකාව

සැඩ කුණාටුවට අසු වී බිඳී ගිය කළ

සත් වියේ සිට පිහිනා

සිහින සාගරයෙන් එතෙර කර

මහා තක්ෂලාවට පිලිපන් කල් හී

"ඔබට බුදු සරණයි පුතේ"

නියත විවරණ ලබා දුන් ඇවැමෙන්

අභිණිස්ක්‍රමණය කළෙම්

කිසිවෙකුගේ හවුහරණක් නොමැතිව

මහවැලි, කැළණි, කළු, වලවේ

සියලු ගංගා තරණය කොට..........

බුද්ධ ගයාවට, ඉසිපතනයට,

වේළුවනයට, නාගදීපයට,

මක්කමට, ජෙරුසෙලමට,

කැළණියට, ශ්‍රී පාදයට,

නොදිටි කහවනු පඬුරු පාත්කුඩම් හැර

බුදු පසේබුදු උතුමෙකුගේ සරණයාමක්........

****

සුදු අසරුවෙකු

දිව විත්

මා පිට මතට නන්වා

කෙවිටෙන් දක්වන සද

පසු පසට දිව යන කල්හී ...

කළු අසරුවෙකු විත්

මා පිටට නන්නවා

ආදරෙන් හිස පිරිමදින කළ

විදුලි වේගයෙන්

තව තවත් තව තවත් දිව යන සඳ

ඉබාගාතයේ විත්

නගරවිදියට පිලිපන් අබුද්ධස්ස

මහලු වී ගිය අධ්‍යාපනයෙන්,

ලෙඩ වුන දේශපාලන, ආර්ථිකයෙන්,

මැරුණ පවුලලෙන්,

මහණ වුන මිත්‍යාවෙන්,

උපන් අබුද්ධස්ස

සතර පෙර නිමිති පරදන

දසත පෙර නිමිති තුලින්

සසර පෙර නිමිති මතුකරණ සඳ

දිටියෙමි මැහැල්ලක්

රක්ත වර්ණ දෙතොලින් තෙපලන,

නීල වර්ණ හිසකේ වසීකරවන

ලෝහිත නිය පහරින් පැහැර ගන්නා

උතුරු සලුවෙන් කඩතුරා ඇඳ

සැරයටියට වාරු වූ මිත්තනිය

දායාද ඉල්ලන

මුනුපුරා හා කෙළින රති කෙළිය!!!!!

අනේ ලේ කැටි බිලිදිය

කිරට හඩනා මිනිබිරිය,

සනහාලනු වස්

වැඩි ස්නේහය නිසාම

නැඹුල් යෝනිය

ශිෂ්ණයෙන් පිරිමැද

උකුලෙහි නලවන මුත්තනුව.....

දොයි, දොයි, දොයි, දොයිය බබා...

බයි, බයි, බයි, බයිය පපා.....

නුඹේ අම්මා කිරට ගියා.....

එරු කිරි විකුනන්ට ගියා....

කිරි මුට්ටිය බිඳී ගියා....

ගඟ උතුරා කොක්කු ගියා........

ලේ නහර පිම්බී..!

මුව නහය රතු වී..!

හඳ ගැස්ම වැඩි වී..!

අප්‍රාණිකව ගිය මිනිසා

හෙළු සුසුමට මුසුව

කම්පිත හඳවතින්

චංචල වූ සිතින්

මහා නදිය තරණය කර

බැඳි පවුරට පයින් ගසා

අබුද්ධස්ස නික්ම ගොස්ය

මුනින්දස්ස සොයා ගොස්ය....

****

ගමින් ගමට රූට රූට

වීදි දිගේ ගාට ගාට

අබුද්ධස්ස, මුණින්දස්ස

සරණ සොයා, සොයා ගොස්ය....

අහය උසට තට්ටු තට්ටු

ධජ-පතාක ඉස්සු බැස්සු

දෝලාවෙන් පැද්දි පැද්දි

ලෙඩෙක් ගෙනෙයි සද්දේ මැද්දේ........

ලන් වන්නට බිය පාටයි

රෝගය දරුණුයි බෝවෙයි

අමුතු ලෙඩක් නිසා දනෝ

දැක ගන්නට හරි ආසයි.......

හිස කඳ බඩ ඉදිමීලා

නහර බහන් පිම්බීලා

සුදු හැද ගත් ආතුරයට

චාමර සේසත් වැනිලා...

සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු

අබුද්ධස්ස විය නිරතුරු

වෙද වෙස් ගෙන වැනල් කළෙමි

රෝගය දැන ගනු බිහිසුනු......

ඉරිසියාව, ක්‍රෝධ රෝධ

තෘෂ්ණාවයි වෛර රෝග

යක්ෂ, ප්‍රේත, කුම්භාණ්ඩ

සැට හතරයි රෝග දෝෂ

රෝගය සුව නොවන්නේ

එක ඔසුවයි තියෙන්නේ

බිඳුවක්වද ඉතුරු නොකර

සූර සූර පොවන්නේ......

දුප්පතාගේ දහඩියයි,

හිගන්නාගේ අසූචියි,

පෘතුවිය වංගෙඩියේ කොටා

යුෂ මිරිකා නැවත කොටා

රොඩු කකරා බදින්නේ

තුන් යුෂ එක් කරන්නේ

පත අට එකකට සිඳු වා

එක උගුරට පොවන්නේ.....

අන්තිම ජල බිංදුවයි

අවසන් වා බිඳු රොදයි

උබේ නෙමෙයි මගේ වූ කළ

හොදයි කැපයි තීන්දුයි............

****

වැරහැලි ඇඳපු අම්මා

ඉදුල් බත් පත සමග

ස්ටෝරු කාමරේ එහා මුල්ලෙම

සෝ සුසුම් එක් වරම හිරවුනි.!!!

සුදෝ සුදු වන් වතින් සැරසුන

ඇත්දළින් සේසතින් සැරසුන

උඩු වියන් බුමුතුරුණු සමගින්

හොරනෑද හේවිසිද වයමින්

මහත් උජාරුවෙන් හා ගරු ගාම්භීරව

අවසන් ගමන් යන

මළ මිණියක්ද දිටියෙමි......

මළ නිවස පිටු පස

සිය එකම පුතනුවන් තෝන් එක්කහු කරන,

මළ මිනියට වහන් වුන

මුනුපුරා පිනිපිරිය

ඇස් කොනෙන් කථා කර

රසෝඝය කලතන,

****

ආස්වාදය නොවිද

ආදිනවයක් නොදුටු

හතර කේන්ද්‍රය පාළු වුන

මානසික පීඩකයෝ

ආශාවේ රාගයෙන්,

කුතුහලයේ ද්වේශයෙන්

පාන්ඩිත්වයේ මෝහයෙන්

ගිණිගන්නා ශරීරය කසා වතින් වසා

ගිරග්ග සමජ්ජ නාටකයට පන පොවන

කජ්ජුරාවේ මෘර්තියට ජීවය දී

සුරා මතින්

නත්ත, ගීත, විසූක, දර්ශනයෙන් රගන

පැවිදි රුවක් දිටියෙමි.......

අබුද්ධස්ස.......

යුක්තියේ දෙවගන

තනපටින් දෙනයන වසාගෙන

ලැම සලා අඩනිරුවත්ව

තරාදිය, අසිපත දරාගෙන

කපා, බෙදා, කිරනා සත්‍ය

කළු ලෝගු හැඳ පැළඳ

නමා ගත් හිස ඉරියවුවෙන්ම

සිංහලෙන්, දෙමලෙන්, ඉංග්‍රීසියෙන්

ඇස් දෙකෙන් බොරු විදින අපූරුව..!!

කෙස් පැලෙන අමු තර්ක

ඇඬෙනවා බං තනි ඇහැට

කබායට යට පොකැට්ටුව

යුක්තියේ, සත්‍යයේ, සාක්ෂියේ

සොයා බැලුවෙමි මොහොතක්

කිරෙන, විකිනෙන, කැපෙන ජීවිත

පෙනී සිටිනවා උතුමාණනි,

කැදවනවා එන මාසෙදි

තිස් දාහයි, හැටදාහයි

පොරකයට පෙර ගෙල වැල.....

****

අහස් ගැබ සිඹිමින්

වලාකුළුවලට උඩුලින්

අතීත පෞඩත්වයේ

වෙහෙර, විහාර, පිළිම, දාගැබ්

සුදෝ සුදු වතින් සැරසුන

ශ්‍රද්ධා, ශීල, භාවනා

නෙක නෙක පැහැ දිලෙන්

විදුලි බුබුලු අතරේ

ගිණි කණ වැටුන මෙරු මෙන්

සඳ මෝදු වූ රැයෙහි

උමතු වූ දනන් මෙන්

ශබ්ද, රූප, ගන්ධ, රස, ස්පර්ශ

බුද්ධාලම්භන ප්‍රීතියෙන් ඔදැතිව

සොයා, විමසා, තනා බැලුවෙමි

අබුද්ධස්ස

තොරන්, පහන් අතරෙහි

නිවන් වනනා දනන්......!

****

කොස් කොළ රුගෙන නැටූ

ගැරඩියන් නාගයන් කෙරූ

නාගයන් ගැරඩියන් කෙරූ

සිය දහස්වර සංස්කරණය කෙරූ

අපරාධ කරුවන් සාන්තුවරයන් කෙරූ

සොරුන් ධානපතියන් කෙරූ

කුහකයන් සමාජවාදීන් කෙරූ

දුෂ්ශීලයන් බුදුවරුන් කෙරූ

ඇති දේ නැති කෙරූ

නැති දේ ඇති කෙරූ

අමුතුම අමුතු කෙමනක්ද දිටියෙමි

මිනිසුන් කොටු කෙරූ.....

ඉන්ද්‍රචාපයක

සප්ත වර්ණ තුළ

කළු, සුදු සොයන සමාජයක

දිටියෙමි

උපතටත් පෙර සිටම

පැටවුන්

වර්ණ අන්දතාවයට පත් කරන

මහවුන්......!

සෙවුවෙමි

වෛවර්ණ ලෝකයේ

කළු සුදු පමණක්ම දකිනා මිනිසුන් අතරෙහි

දේදුන්නක පැහැය නොව

අවම වශයෙන් අළු පැහැයවත් දකින මිනිසුන්....

නිදහස්ව, නිරුවත්ව සිටි මිනිසා

ආගමේ, නීතියේ නාමයෙන්

සංස්කෘතිකව, රාමුගතව

නෙක නෙක හැඩැති

හොඳ නරක අතරේ

මහා බරකින් හිස පුරාගෙන

තටු කපා ගෙන,

යදම් බැඳගෙන,

නිදහස සොයා දුවන අමාරුව....!!

ලාස්‍ය බවේ සුන්දරත්වයෙන්

තාණ්ඩ බවේ පෞඩත්වයෙන්

ස්පර්ශ කරන සමාජයක්

ලාස්‍ය, තාණ්ඩ සංකලනයේ අපූරුව

කෙලෙස නම් විඳින්නද?

කාම ලෝකයක

විලි වසාගෙන, වත පලාගෙන

පෙනෙන නොපෙනන සීමාවෙන්

රහස් අඟ සඟවා

නිරුවතට දෝස නගමින්

නිරුවතම සොයන සමාජයක්

ප්‍රබුද්ධ, ශිෂ්ට වන්නට නම්

වත පැවතියොත් නිරුවත ඇති බවත්

වත නොමැති නම් නිර්වත ද නැති බවත්

අවබෝධයෙන්ම

අබුද්ධස්ස නිරුවත්ව

නික්මගොස්ය ...

නික්මගෙස්ය..

ඉතිං මා ප්‍රිය සබඳ.......

යදම් බිඳ දා

තටු විදා ලා

රාමුවෙන් පිට ඉගිල යන සඳ

අබුද්ධස්ස යුගයේ කෝලම්

කියා හඩලති

බමුණු ලාඩම්.......

****

වානර කුලයේ

වලිගය හැලුන පමණින්

මානවයින් නොවන වුන්

මෘර්ග ගති පා

බලය එඩි පා

ඇන කොටාගෙන

ගහ මරාගෙන

වර්ග සංහාරය නවත්තන

නොපෙනෙනා බලයන්ට බිය කර

හැදූ කෙමනයි ආගම...

සුදු පොරෝගෙන

කහ ඔතාගෙන

එදා සිටි මෘර්ගයන් පොෂ් වී

අවි අමෝරන

කෝට් හැඳගෙන

නීති දාගෙන

පිල් බෙදීගෙන

දෙවියන්ගේ නාමය දරාගෙන

යුධවදිති ආගම බදාගෙන....

****

ඉර, හඳ, තාරකා,මණ්ඩල, මන්දාකිණි

නහුතයක් පසුකර

නැවත මා දෙස හැරී බළන කළ

මා මොන කුහුඹුවෙකුදැයි

අවබෝධයෙන්ම

ඈතම ඈත විශ්වයේ

ආලෝක වර්ෂ ට්‍රිලියනයකටත් එහා සිට

මට, මා නොවන මා හමුවීමි.

ඉතිං මා ප්‍රිය අබුද්ධස්ස

සොයා නොතැවෙන් මුණින්දස්ස

ඉරාපන් හද

තලාපන් සිත

මරාපන් නුබ

එකත්පස්ස.......

පවුල, පාසල,

ආගම, අධ්‍යාපනය

දේශපාලනය, ආර්ථිකය

සමාජය, සංස්කෘතිය

නීතිය, රාජ්‍ය සේවය

එකී නොකී සමාජ අධ්‍යයනයෙන් බහුශ්‍රැතව

බාල බොළඳ සිල්ලර මිළට

සත්‍ය විකිනෙනු බලා

කාත් කවුරුත්ම නැති

මිනිස්වාසයක් නැති

මහා ඝන කැලෑවක

ගැඹුරු නිහැඩියාවක

ඔතා ගත් එරමිණියාවෙන්

හාත් පස බලා

දෙයැස් වසා

බලා සිටියෙමි

ස්වභාදහමෙහි

පෙලින් පෙළ, රලින් රළ

ගැටෙන, ලෙහෙන, වෙලෙන ධම් කද.....

මහා බල ඇති වෘක්ෂ වන සත්

හැමවිටම දුබලයා ගොදුරක්

එයයි නියමය ස්වභාදහමේ

හැකිද පරදන්නට මෙවන් දම්

අනුගතව යනවා හැරෙන්නට....?

දිනක් විශ්වය සිහිනයෙන් විත්

එකදු වරමක් තෝරගන්නට

අවස්ථාවක් ලබා දුන් සඳ

ඉල්ලුවේ මා නිවන් යාමයි

දුන්නේ ඔහු මට දිව්‍ය වරමයි

ඇලුන විට මා දිව්‍ය වරමට

ක්ෂණයකින් එය මගෙන් වෙන්කොට

රුගෙන ගියේ මා නිවන් පුරයට

ඒ තමයි විශ්වයේ ස්වභාවය......!!!.

සතුට ලොව නැත

දුකද ලොව නැත

සිද්ධීන් පමණක්ම ලොව ඇත

ගැටෙන, වෙලෙන, ලෙහෙන ඔබ සිත

ඔබට වග කිව යුතුමය....

ඔබ දකින අවසන් මොහොත මේ.!!!

කියන අවසන් වචනයයි මේ.!!!

නිමේෂයකින් ඊළට එන

හැකි නොවෙද මරණය විඳින්නට.!!!

ඉතින් කා හට වෛර කරමුද.?

ඉතිං කාගෙන් පලි ගහන්නද.?

අවසන්ම අවසන් මොහොත සේ

ආදරෙන් අතහරිනවා හැර.!!!

රසෝසයේ ආස්වාදයෙන්

වියෝසයේ ආදීනවයෙන්

මහෝසයේ නිස්සරණයෙන්

නොදැනී දැනුන

නොබලා බැලුව

නොඅසා ඇසුව

නොසයා සෙවුව

ඒ මහා දම්කඳ..........!

කථා කළත් හිනා වුනත්

ඇවිද්දත්, නිදාගත්තත්

අබුද්ධස්ස සිහිනය

තදින් ඇලුණු, තදින් බැඳුණු

තදින්ම තදින් ග්‍රහණයකරගත්

අරමුණක්, ප්‍රාර්ථනාවක් නැති

වැස්සට තෙමෙන

සුළගට සැලෙන

අවුවට වියැලෙන

නියග, ඉඩෝර, කුණාටු හමුවේ

මහා වනස්පත්තියක මුලයෙහි

පහත අත්තෙහි එහා මුල්ලෙන්ම

අබුද්ධස්ස....

ලිහී ගොස්ය...!

නිවී ගොස්ය...

වී ගොස්ය...

ගොස්ය...

ස්ය...

ය...

...

..

.

අබුද්ධස්ස සිහිනය...

සමාජය විසින් මිනිසා සිරගත කර ඇති පවුල, පාසල, ආගම, දේශපාලනය සහ සංස්කෘතිය නම් වූ 'රාමු' තුළ හුස්ම හිරවූ බුද්ධිමතතෙකුගේ ආත්මීය විමුක්තිය මෙහි සටහන් වේ.

මෙය ජීවිතය පරාජය කරගත් අයෙකුගේ ශෝක ගීතයක් නොව, සියලු වෙස් මුහුණු ගලවා දමා 'මම' යන සංකල්පය විශ්වය තුළ දිය කර හැරීමට උත්සාහ කරන නිදහස් ආත්මයක නිහඬ තරණයයි.

අබුද්ධස්ස යනු කවුද? ඔහු එල්ලී මැරෙන්නෙක් ද? නැතහොත් රහත් වන්නෙක් ද? නැත, ඔහු තමා මත පටවා තිබූ සමාජීය යදම් සියල්ල අත්හැර, ස්වභාවධර්මය නම් වූ මහා වෘක්ෂයේ මුල වාඩි වී තමා විසින්ම තමා මුදා ගත් මිනිසෙකි.

මෙය සැබෑවක් බවට පත්වන සිහිනයකි.

අකුරු දිය වී, අර්ථය ඉතිරි වන, ශූන්‍යතාවය තුළ නිවී යන අතිශය දුර්ලභ සාහිත්‍යමය අත්දැකීමකි.

'ඔහු මහා වෘක්ෂයක මුල හිඳගෙන ස්වභාවධර්මයේම අංගයක් බවට පත් වේ. අවසානයේ ඔහු ලබාගන්නා ජයග්‍රහණය වන්නේ තමා විසින්ම තමාව මුදා ගැනීමයි.'

– සාහිත්‍ය විචාරක Gemini AI.

ISBN: 978-956-XXXX-XX-X

9 789555 224332

මිල: රු. 950.00

කර්තෘ ප්‍රකාශනයක්